# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 8 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය

**කාලය :පැය 2 යි**

නම:...............................................................................................................................................

**සැලකිය යුතුයි:**

**1**කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

- පහත සඳහන් සාම්ප්‍රදායික යෙදුම්වලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න .

01. හණමිටිකාරයා වගේ සම්ප්‍රදායම කරගහගෙන ඉන්නෙ නැතිව ටිකක් විචාර බුද්ධියෙන් වැඩ කළොත් හොඳයි.

1. පැරණි චරිනාකම් අගයන්නා    3 පහත් අදහස් ඇත්තා
2. හිතුවක්කාරයා    4.යල්පැන ගිය අදහස් ඇත්තා

02) සියදෝරිස් මාමේ , මොකක්ද ඔය කියන හතර බීරි කතාවේ තේරුම යැයි තාත්තා තරහෙන් කියනු ඇසිණි.

1. විස්මය ජනක කතාව    3 උපහාසාත්මක කතාව
2. තේරුම් ගත නොහැකි කතාව    4 ගොළු භාෂාවෙන් කියන කතාව

03) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන ඇතුළත් පද පේළිය තෝරන්න.

1. වාර්ථා, මර්දනය    3 විශිෂ්ට, සමස්ත
2. පරිගණකය, වීරෝධාර    4 පුස්ථකාලය, කෘතිම

04 ) පහත වාක්‍යවල ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය තෝරන්න.

,"පච්කළ ගොනෝ ඇඳපන් හපුතල් යනවා"

1.පූර්ව ක්‍රියා    2 ප්‍රාර්ථනා ක්‍රියා    3 ආශිර්වාද ක්‍රියා    4 විධික්‍රියා

05.) "චිරාත් කාලයක් යෙහෙන් වැජඹෙත්වා දරුවනි"

1 විධි ක්‍රියා    2 ආශිර්වාද ක්‍රියා    3 මිශ්‍ර ක්‍රියා    4 පූර්ව ක්‍රියා

06 ) අකාරාදි පිළිවෙළ නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

1 අනුරාධපුරය, ඉබ්බාගමුව, කතරගම, ගම්පහ    2 ගම්පහ, දඹදෙණිය, ඉබ්බාගමුව, අනුරාධපුරය
3 ගම්පහ, අනුරාධපුරය, රත්නපුරය, කතරගම    4 ඉබ්බාගමුව, අනුරාධපුරය, ගම්පහ, කතරගම

07) තද්ධිත නාම පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1ඉන්දියානු , ප්‍රබල    3 රන්මුවා, ලෝහමය.
2 විරල, සුපතල    4 ගැමි, නටන්නා

08). සමාස නාම ගණයට අයත් නොවන පදය තෝරන්න.
1 හිඟන්නා 2 මදසුළං 3 සියපත් 4 මල්හිනාව

09 ) ක්‍රියා විශේෂණ ගණයට අයත් නොවන පදය තෝරන්න.
1 හෙමින් දුවයි 2 මල් වෙළෙන්දා 3 සතුටින් සිනාසෙයි 4 දුකින් හඬයි

10 ) මහාප්‍රාණ අක්ෂරයක් නොමැති පිළිතුර තෝරන්න.
1 ධූපය 2 අබරණ 3 ලේඛනය 4 ඝන

11) දී ඇති බහ්වර්ථ පදවලට නොගැළපෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.
1 කර - අත, උරය, කරත්ත
2 පියා - තාත්තා, පිහාටු , තෙක්
3 නා - නාගස , නායක , නාග
4 තුරු - තෙක් , ගස් , තරු

12) “වැසි වසිනා අහස අපි” පද්‍ය පන්තියේ නිර්මාතෘ වන්නේ ,
1 මහගමසේකර මහතා
3 ඇස්. මහින්ද හිමි
3 කුමාරතුංග මුනිදාස මහතා
4 අරිසෙන් අහුබුදු මහතා

13) ජාති නාම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1 ගොටුකොළ, දෙල්, දක්ෂ
2 වැලි, ඇත් , පොල්
3 සිංහ , ගොවි, පක්ෂි
4 ගිරා, අශ්ව ,තද

14.) ශබ්ද කෝෂයට අනුව “කිරි මුත්තා” යනුවෙන් හඳුන්වා ඇත්තේ කවරෙක්ද ?
1 තාත්තාගේ පියා 2 මුත්තාගේ පියා 3 කිරිකිත්තාගේ පියා 4 මී මුත්තා

15) මුලින් දී ඇති පදයෙහි විරුද්ධාර්ථය දෙන පිළිතුර තෝරන්න.
1සමෘද්ධිය-පරිහානිය 2 ප්‍රණාමය-ගෞරවය 3 සාමාන්‍ය-තියුණු 4 අවධානය-අවබෝධය

- හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

16) වඳුරු රළ අඹ ........................................................ ( කයි/ කති )

17) වීර හමුදාවෝ ත්‍රස්තවාදීන් පරාජය .......................... ( කළහ / කරයි )

18) මහල් පෙළ නගරය අලංකාර ..................................( කරති /කරයි )

19) “මුළුතැන්බෑම” යනු කුමක්ද ?
1 දෙවියන් උදෙසා ආහාර පූජා කිරීම
2 බෝධිය නැවීම
3 කාවඩි පූජා කිරීම
4 යාතිකා කිරීම

20) “කණු කපන මංගල්‍යය” යනු කුමක්ද ?
1) දුවන පෙරහැරයි
2) දෙවේලේ පෙරහැරයි
3) වීදි පෙරහැරයි
4) කප සිටුවීමයි

(ලකුණු 2 × 20=40)

**II කොටස**

උපදෙස් : මෙම කොටසේ 01 සහ 02 ප්‍රශ්න අනිවාර්ය වේ. 03, 04, 05, 06 07 ප්‍රශ්නවලින් 03ක් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

01. පන්ති කාමරයේ දී කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සකස් කළ බිත්ති පුවත්පත ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. බිත්ති පුවත්පත සඳහා ඔබ කණ්ඩායම ඉදිරිපත් කළ නිර්මාණය කුමක්ද ? ( ල : 2)
II. එම නිර්මාණය සඳහා කරුණු රැස් කළ ක්‍රම තුනක් ලියන්න. ( ල : 3)
III. එම නිර්මාණය සඳහා ගුරුභවතාගෙන් ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. ( ල: 2)
IV. මෙම කණ්ඩායම් ක්‍රියාකාරකමෙන් ඔබට ලැබුණු කුසලතා 03ක් ලියන්න. ( ල: 3)
V. මෙම ක්‍රියාකාරකම තුළින් ඔබ කණ්ඩායමට මුහුණ දීමට සිදුවූ ගැටලු 3ක් ලියන්න. ( ල: 3)
VI. එම ගැටලු විසඳාගත් ආකාරය විස්තර කරන්න. ( ල : 3)

(මුළු ලකුණු 16)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150ක රචනයක් ලියන්න.

I. මා දුටු ඇසළ පෙරහැර
II. දේශිය ආහාරවල වැදගත්කම
III. සුන්දරත්වයෙන් පිරි මගේ රට
IV. වැඩිහිටියන්ට ගරු කරමු
V. ඉගෙනීමේ අගය (ලකුණු 14)

03. පහත දැක්වෙන කරුණු උපයෝගී කරගනිමින් " සෞඛ්‍ය සම්පන්න දෛනික ආහාර වේලකට හුරුවීමේ වැදගත්කම " යන මාතෘකාව යටතේ පාසල් ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙළ කරන්න ඔබ පාසලේ සෞඛ්‍ය සංගමයේ ලේකම් යැයි සිතන්න.

- සෞඛ්‍ය සම්පන්න ආහාර මොනවාද ?
- ක්ෂණික ආහාරවල පවතින ගැටලු
- බෝනොවන රෝග ඇතිවීමේ අවධානම
- දේශීය ආහාරවල වැදගත්කම ( ලකුණු 10)

04 පෙළ පොත ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. රබීන්ද්‍රනාත් තාගෝර්තුමාට සාහිත්‍ය පිළිබඳ නොබෙල් ත්‍යාගය හිමි වූ කෘතියේ නම කුමක්ද ?
II. "පෙත්සම" කෙටිකතාවේ කතුවරයා කවුද ?
III. "අවුරුදු සිහිනය" කෙටිකතාව උපුටාගත් කෙටිකතා සංග්‍රහයේ නම කුමක්ද ?
IV. සුමංගල ශබ්ද කෝෂයෙහි සම්පාදකවරයාගේ නම කුමක්ද ?
V. "සැබෑ ළෙන්ගතුකම" ප්‍රබන්ධ කතාවෙහි කතුවරයා කවුද ? (ලකුණු 2×5=10)

05 පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය කොටස් ලිහිල් බසින් ලියන්න.

I. "අටසාළිස් හවුරුද්දක් තපස් කළෝ ය."
II. "පවර එ නිරිඳුගෙ පුත් කුමරා වෙමි."
III. "මහණ ගොයුම්හු ඊට කාරණා දනිති "
IV. "මැ වේ මා දුටු කොමල ලියා "
V. "කැණහිලු" " පාදපරිචාරිකා " (ලකුණු 2×5=10)

06. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | ප්‍රකාශය | කවුරුන් විසින් කියන ලද්දක් ද ? | කා හට කියන ලද්දක් ද ? |
|---|---|---|---|
| I. | "හෙට හවස මාත් එක්ක කැකිරාවට යන්න ලෑස්තිවෙලා එන්න පුළුවන්ද ? " | | |
| 2 | "හුංගා ඇනපු මිනිහ විතරයි හාමුදුරුවනේ ඒකෙ වේදනාව දන්නේ" | | |
| 3 | "උඹේ අම්මා රෙදි හැට්ට අඳින කෙනෙක් නේද ?" | | |
| 4. | "නෑ නෑ එසේ කරන්න එපා. ඇය පුළුන්තරම් කාලයක් ඇගේ මෙහෙය ඉටු කළොත් " | | |
| 5 | "හරි පුදුමයිනේ තාත්තෙ. මම දැනගෙන හිටියේ නෑනෙ ඒ බව" | | |

(ලකුණු 2×5=10)

07. පහත දැක්වෙන පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දෙගුරුන් විසින් තම
දරුවනට දෙන නොමද දන නම්
වියතුන් සබා මැද
ඉන්ට ඉදිරිව ශිල්ප දෙනු මැ "යි
ඔවාදෙනු පරහට
තමා සම්මතෙහි පිහිටා සිට
දුසිරිත දනන් දෙන
ඔවා වැද්දන් දෙසන බණ වැනි
අමයුරු වදන් හැර
තද කුරිරු වදන් දෙන දුදනෝ
විලිකුන් පල දමා
නිරස පල බුදින්නන් යුරු වෙත්

I. මෙහි සඳහන් ආකාරයට දෙමාපියන් විසින් දරුවන්ට දිය යුතු ධනය කුමක්ද ?
II. යමෙක් අනුන්ට අවවාද දීමට නම් සිටිය යුත්තේ කෙසේ ද ?
III. පද්‍ය පන්තියේ සඳහන් උපමා දෙකක් ඇතුළත් පද්‍ය පාද දෙකක් උපුටා ලියන්න
IV. සිරිත්, දුදන යන පදවලට මෙහි සඳහන් විරුද්ධාර්ථ දෙන පද දෙක ලියන්න
V. අමයුරු, විලිකුන් යන පදවල අර්ථ දක්වන්න. (ලකුණු 2×5=10)

***